# සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තයේ යොදාගනු ලබන දැනුම හා තාක්ෂණය

*ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.කේ.ජී.ඩබ්ලිව්.සී.පී.කේ. විජේරත්න[1]*

ලාක්ෂා කර්මාන්තය නැතහොත් ලාකඩ කර්මාන්තය පිළිබඳ මෙම පර්යේෂණ වාර්තාව තුළින් සාකච්ඡා කරනු ලබන අතර එහිදී විශේෂයෙන් ම ලාක්ෂා ශිල්පීන් විසින් භාවිතා කරන ලද ශිල්පය දැනුම හා තාක්ෂණය පිළිබඳ අධ්‍යයනය කරනු ලබයි. පර්යේෂණය මගින් සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තයේදී භාවිතා කරනු ලබන දැනුම හා තාක්ෂණය පිළිබඳව සහභාගිත්ව නිරීක්ෂණය යටතේ තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි. ලාක්ෂා කර්මාන්තය නැතහොත් ලාකඩ කර්මාන්තය වසර හාරදාහක් පමණ පැරණි කර්මාන්තයකි. මෙම කර්මාන්තය පිළිබඳ කව්සිළුමිණ, පූජාවලිය, ගිරා සංදේශය, අමාවතුර, ධම්පියා අටුවා ගැටපදය තුළ තොරතුරු දැක්වෙන අතර ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදනය යනු නූතනය වන විට ලොව පුරා විශාල ආකර්ෂණයක් දිනාගත් නිෂ්පාදනයකි. ක්‍රිස්තු පූර්ව 288 සංඝමිත්තා තෙරණියගේ දුමින්දාගමන යත් සමඟ කුල දහ අටක් ලංකාවට පැමිණි අතර ඒ අතර පැමිණි ඊ වඩුවන් ලාක්ෂ කලාවේ පරපුර විය. වර්ෂ 1634-1654" 1634-1984 කාලය දෙවන රාජසිංහ රජුගේ රාජ්‍ය කාලයේ කඩා පොල විජේපාල නම් රජුගේ පාලන කාලයේ අච්අතමිටි, මුරායුධ, හැරමිටි නිර්මාණයට මෙම ලාක්ෂා යොදාගෙන ඇත. ලාක්ෂා සෑදීමේදී එය හෙම්ටෙරා ගෝත්‍රයට අයත් කොකසයිට් කෘමියා විසින් ශ්‍රාවය කරන දුම්මල වැනි ස්‍රාවයක් ආශ්‍රයෙන් සකස් කර ගැනීම සිදුකරනු ලබයි. කෝන්, මසන්, කැපිපෙටියා, කොබ්බෑ ශාකය තුල මෙය සෑදෙන අතර මෙම ශාකයේ අතු ඉති මත කෘමීහු ශ්‍රාවය කරනු ලබන මෙම ශ්‍රාවය තුළින් කබලු වශයෙන් සෑදෙන මෙම ලාකඩබොර ලාකඩ ලෙසින් හඳුන්වනු ලබයි. පසුව ඒවා මද පවනේ වියළා පෙරා කහට ඇදීම සිදු කරනු ලබන අතර යකඩ පතුරු පිරිමැද නූල් ඇදීම තුළින් මෙය සිදුකරනු ලබයි. මෙහිදී කළු වර්ණය, කහ වර්ණය, රතු වර්ණය නිර්මාණ සඳහා ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිතා කරනු ලබන අතර මෙමගින් නියපොතු වැඩ හා පට්ටල් වැඩ ලෙස පාරම්පරික ශිල්ප ක්‍රමයේ කලාත්මක අංගය මගින් සකස් කරනු ලබයි.මෙහි දී කට්ටලයක් භාවිතා නොකොට මහපටැඟිල්ලෙ නිය ආධාරයෙන් ආක්ෂා නිර්මාණය කිරීමේ නියපොතු වැඩ වන අතර කලින් සකසා ගත් භාණ්ඩය ලාක්ෂා කෙදි මගින් සැරසිලි මෝස්තර යෙදීම මෙහිදී සිදු කරයි. ලාක්ෂා මෝස්තර දැමීමේ අනිත් අනිත් අංගය වන්නේ පට්ටල් දැමීමයි. භාණ්ඩ ඔප දැමීම,පටි ගැසීම,කැටයම් කිරීම උදෙසා මෙය උපයෝගී කර ගනු ලබන අතරඉතා සංයමයකින් කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ එක් සංස්කෘතික අනන්‍යතාවයක් හෙළි කරනු ලබන විශිෂ්ට පාරම්පරික නිර්මාණයක් ලෙස මෙම ලාක්ෂා කර්මාන්තය යොදාගනු ලබන අතර සංස්කෘතික ශිල්ප ක්‍රම හා ශිල්පීන් රැක ගැනීම සියලු දෙනාගේ වගකීමක් වේ. සම්ප්‍රදායික ලාක්ෂා කරුවන් විසින් යොදාගනු ලබන දැනුම හා තාක්ෂණය සහශිල්පීය දක්ෂතාවය පිළිබඳ පර්යේෂණය තුළින් ඉදිරිපත් කරනු ලබයි.

***ප්‍රමුඛ පදඃ*** නියපොතු වැඩ, පට්ටල් වැඩ , හෙම්ටෙරා ගෝත්‍රය, කෘමීන්

[1] පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. mailto:ssh2020519@ssh.rjt.ac.lk